Department of Education, Sabaragamuwa Province/ Weekly School

සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල

විෂය - චිත්‍ර කලාව

අගෝස්තු 04 සතිය

ශ්‍රේණිය - 10 (III වාරය)

සැකසුම - රූපිකා ජයන්ති (සිරිසමන් ජා. පා.)
දැරණියගල කොට්ඨාසය

පාඩම/ඒකකය - 2.2.5 ප්ලාස්ටික් ජෝගුවක්, රෝල් කරන ලද කඩදාසි, පලතුරු ගෙඩියක් (දොඩම්, දිවුල්, ඇපල්), මුද්‍රිත රෙදිකඩක් චිත්‍රණය කරමු

## ප්ලාස්ටික් ජෝගුවක්, රෝල් කරන ලද කඩදාසි, පලතුරු ගෙඩියක් (දොඩම්, දිවුල්, ඇපල්), මුද්‍රිත රෙදිකඩක් චිත්‍රණය කරමු

1. ඉගෙනුම් ආධාරක

- ද්‍රව්‍ය සම්පිණ්ඩන දෙකක් ඔබට ලබා දී ඇත





2. ක්‍රියාකාරකමෙහි නිරත වීමට උපදෙස්

- ඔබට ලබා දී ඇති ද්‍රව්‍ය සම්පිණ්ඩන එක එකක් හොඳින් නිරීක්ෂණය කරන්න
- පහත සඳහන් ලක්ෂණ මීට පෙර 2.2.4 පාඩමට අනුව විස්තරාත්මක ව අධ්‍යයනය කරන්න
  - හැඩතලවල වෙනස්කම්
  - පරිමාණය
  - පර්යාලෝකය
  - ත්‍රිමාණ ලක්ෂණ
  - ගැඹුර
  - ගතිලක්ෂණ

3. ඇගයීම

1. අඳින ලෑල්ල මත තබන ලද,

   - ප්ලාස්ටික් ජෝගුවක්,
   - දොඩම්, දිවුල් හෝ ඇපල් ගෙඩියක්,
   - රෝල් කරන ලද කඩදාසියක්,
   - මුද්‍රිත (චීත්ත) රෙදිකඩක් තබා ඇතැ යි සිතා ආදර්ශවලට අනුව දළ සටහනක් ඇඳගන්න.

2. එකිනෙකට ආවරණය වන පරිදි මනසින් ගොඩනගා ගෙන, නිවැරදි ව හැඩතල අඳින්න.

3. පරිමාණය,

   පර්යාලෝකය,

   ත්‍රිමාණ ලක්ෂණ,

   ගැඹුර පෙන්වමින් චිත්‍රය ගොඩනගා ගන්න.

4. වර්ණ කිරීම සඳහා පැස්ටල් හෝ දියසායම් භාවිත කරන්න.

5. ඒ ඒ භාණ්ඩවල හා ශාක කොටස්වල එම ගති ලක්ෂණ එන ලෙස පාට කරන්න.

6. දියසායම් භාවිතයේ දී විනිවිද පෙනෙන සේ වර්ණ කරන්න.

7. පැය දෙකක කාලයක දී නිම කරන්න.